www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පකිස්ථානය තුල භුටෝ ඝාතනය කෙරෙහි විරෝධය මැඩීමේ රාජ්‍ය ප්‍රචණ්ඩත්වය

## Pakistan: Violent state repression of protests over Bhutto assassination

**කීත් ජෝන්ස් විසිනි**
**2007 දෙසැම්බර් 31**

පකිස්ථානු ජනතා පක්ෂයේ (පීපීපී) නායිකාව වූ ද, හිටපු අගමැති හා එලඹෙන මැතිවරනයේ අගමැති අපේක්ෂිකාව වූ ද බෙනාසිර් භුටෝ 27 දින ඝාතනය කිරීමට එරෙහිව ඇවිලී ගිය කැරලි මැඩීමට අවශ්‍ය ඕනෑ ම පියවරක් ගන්නා ලෙස පකිස්ථානු ජනාධිපති පර්වේස් මුෂාරෆ් විසින් 29 වන දින මිලිටරියට හා අනෙකුත් ආරක්ෂක අංශවලට නියෝග කලේ ය.

පකිස්ථානයේ කුප්‍රකට ත්‍රස්තවාදයට එරෙහි පනත යටතේ කැරලි කරුවන්ට එරෙහිව නඩු පවරන ලෙස මුෂාරෆ් උපදෙස් දුන්නේ ය. විශේෂයෙන් ම භුටෝගේ උපන් බිම වන සින්ඩ් පලාතේ ද අනෙකුත් ප්‍රධාන නගරවල ද දැනට මත් හමුදාව යොදවා ඇත. 29 වන දින මුලු මහත් පකිස්ථානය ම මහා වැඩ වර්ජනයකින් ඇනහිටියේ ය.

30 වන දින මාධ්‍ය වාර්තාවලට අනුව කැරලිවලින් අඩුම තරමින් 44 ක් වත් මියගොස් ඇත. එහෙත් පොලිසියේ හා මිලිටරියේ මැදිහත් වීම නිසා මියගිය පුද්ගලයන් ගනන සඳහන් කිරීමට ඔවුන් අසමත් විය.

පොලිස් මුරපොලවල්, දුම්රිය ස්ථාන, මැතිවරන කොමිසමේ කාර්යාල ඇතුලු ආන්ඩුව සංකේතවත් කල ගොඩනැගිලි ද, ව්‍යාපාරික ස්ථාන මෙන් ම මිලිටරියේ පිටුබලය ලබන මුෂාරෆ් හිතවාදී පක්ෂයක් වන පකිස්ථානු මුස්ලිම් ලීගය (කිව්) සමග සම්බන්ධ දේශපාලඥයන් ගේ කාර්යාල හා නිවාස ද, කැරලි කරුවන්ගේ ඉලක්ක බවට පත්විය.

ජනවාරි 8 වන දිනට සැලසුම් කර තිබූ ජාතික හා පලාත් මන්ත්‍රන සභා මැතිවරනවලට භුටෝ සම්බන්ධව සිටිය ද, මුෂාරෆ් තන්ත්‍රය මැතිවරන වංචාවලට සූදානම් වන බවට ඇය යලියලිත් චෝදනා කල අතර අකටයුතුකම් රාශියක් පෙන්වා දුන්නා ය. මැතිවරන නිරීක්ෂන කටයුතු භාරව සිටින ආන්ඩුවේ පලාත් ආයතන මිලිටරි තන්ත්‍රයේ ගැත්තන් අත පවතින බවට ඇය චෝදනා කලා ය.

බොහෝ පකිස්ථානුවන් භුටෝගේ මරනයේ වගකීම පවරන්නේ එක්සත් ජනපදයේ පිටුබලය ලබන හමුදා ආන්ඩුවට ය. එය හෝ පකිස්ථානු මිලිටරි බුද්ධි අංශයේ කොටස් ඝාතනය සෘජුව ම සංවිධානය නොකලේ නම් භුටෝට අවශ්‍ය ආරක්ෂාව නොසැපයීම මගින් ඔවුන් ඝාතනයට පසුබිම සකස් කලහ.

බෝම්බ අවුල්කරන උපකරන හා වෙඩි නොවදින වාහන වැනි පූර්න ආරක්ෂක පහසුකම් සඳහා වූ ඇගේ ඉල්ලීම් ඉටු කිරීම ආන්ඩුව විසින් ප්‍රතික්ෂේප කල බවට භුටෝ වරින්වර පැමිනිලි කර තිබුනි. මිනිසුන් 140 ගේ ද ජීවිත විනාශ කල ඔක්තෝබර් 18 වන දින ඇගේ ජීවිතයට හානි කිරීමේ උත්සාහය පිලිබඳව ඇය මුෂාරෆ්ට ම නොවුනත් මිලිටරි බුද්ධි අංශයේ කොටස්වලට ප්‍රසිද්ධියේ ම චෝදනා කර තිබුනි.

වොෂින්ටන් පෝස්ට් පත්‍රය ආන්ඩු විරෝධී උද්ඝෝෂන පිලිබඳව 30 හැවිරිදි ට්‍රක් රථ රියැදුරෙකු ගෙන් මෙසේ උපුටා දක්වා තිබුනි. "මේ මිනිසුන්ගේ ආවේගයයි. ඔවුන්ගේ ස්වාභාවික ප්‍රතිචාරයයි."

භුටෝ ඝාතනය සිදුවූයේ කෙසේද යන්න පිලිබඳව ආන්ඩුවේ හේතු දැක්වීම් තුල විවිධ ප්‍රතිවිරෝධයන් මතුවීමත් සමග ම මෑත දිනවල පාලන තන්ත්‍රයට එරෙහි මහජන ආකල්ප තවත් දැඩිවී ඇත. මේ අතර, භුටෝ ඝාතනයේ සෑම වගකීමකින් ම පකිස්ථානු ආඥාදායකයා හා මිලිටරි බුද්ධි අංශය මුදා හැරීම සඳහා බුෂ් පරිපාලනය මුෂාරෆ් වටා රොක් විය. පසුගිය දශක පහ තුලම පකිස්ථානු මිලිටරිය පෙන්ටගනයේ කිට්ටු සගයෙක්ව සිටියේ ය.

එක්සත් ජනපදයේ ඇෆ්ගනිස්ථාන ආක්‍රමනය හා වාඩි ලෑමේ කඩඇනය බවට පත්වෙමින් මුෂාරෆ් ආන්ඩුව ඊට සහයෝගය දී ඇතුවාට අමතරව මධ්‍යම හා දකුනු ආසියාවේ ද මැදපෙරදිග ද වොෂින්ටනයේ භූ දේශපාලනික අරමුනුවලට සහයෝගය දීම මගින් "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ ප්‍රධාන සහකරුවෙක්" ලෙස 1999 කුමන්ත්‍රනයකින් බලය පැහැරගත් හමුදා නායකයා බුෂ් පරිපාලනයේ ප්‍රශංසාව දිනාගත්තේ ය. ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද රූකඩ පාලන තන්ත්‍රයට එරෙහිව සටන් වදින්නවුන්ට පකිස්ථානය තුලින් ලැබෙන සහයෝගය පාගාදැමීමේ උත්සාහයේ දී ප්‍රමුඛ ක්‍රියා කලාපයක් ඉටු කරන සිය ගනනකින් සමන්විත එක්සත් ජනපද විශේෂ හමුදා සේනාංකයකට රට තුල මෙහෙයුම් ඇරඹීම සඳහා මෑත සතිවල දී මුෂාරෆ් විසින් ඉඩකඩ සලසා දී ඇත.

ඝාතනය තනිකර ම ඉස්ලාමීය මූලධර්මවාදීන්ගේ ක්‍රියාවක්ය යන මුෂාරෆ් තන්ත්‍රයේ තානය බුෂ් පරිපාලනය මෙන් ම සුවච කීකරු එජ මාධ්‍ය විසින් ද ඩැහැගෙන තිබීම බලාපොරොත්තු විය යුත්තකි. භූටෝ හා ඇගේ පීපීපී ය කෙරෙහි මිලිටරියේ දැඩි විරුද්ධත්වය මෙන් ම පකිස්ථානු මිලිටරි ආරක්ෂක අංශ හා අල්කයිඩා හා තලේබාන් ද ඇතුලත් රැඩිකල් ඉස්ලාමීය මූලධර්මවාදී කන්ඩායම් අතර දශක ගනනාවක් පවතින බැඳීම් ද මේ මගින් නොතකා හරියි.

1970 ගනන්වල හය වසරක් පකිස්ථානය පාලනය කල බෙනාසීර් භූටෝගේ පියා වූ සුල්ෆිකාර් අලි භූටෝ 1977 මිලිටරි කුමන්ත්‍රනයකින් බලයෙන් පහකල අතර දෙවසරකට පසුව එජ පිටුබලය ලත් මිලිටරි ආඥාදායක සියා උල් හක් යටතේ එල්ලා මරන ලදී.

මුෂාරෆ්ට දිගට ම සහයෝගය දෙන්නේ දැයි 28 වන දින විමසූ අවස්ථාවේ එජ සහකාර රාජ්‍ය ලේකම් රිචඩ් බවුචර් පැහැදිලිව ප්‍රකාශ කලේ එක්සත් ජනපද සහයෝගය ඉවත් කිරීම ප්‍රශ්නයට භාජනය නොවන බවයි. "මතුව ඇත්තේ ත්‍රස්තවාදයට විරුද්ධව සටන් කරනවාද නැද්ද යන්නය." යි ඔහු සඳහන් කලේ ය.

භූටෝ ප්‍රමානවත් තරමින් ආරක්ෂා කිරීමට මුෂාරෆ් තන්ත්‍රය අසමත් වූයේය යන වාර්තාකරුවෙකුගේ අදහස බැහැර කල බවුචර්, "මා සිතන්නේ එය 27 දා සිදුවූයේ කුමක්ද යන්න ගැන පූර්ව විනිශ්චයක් වන බවය" යි සඳහන් කලේ ය. " එකිනෙකා මරාගැනීමට කැමති මිනිසුන් සිටිනා තැනක ඔබට නොබිඳිය හැකි කිසියම් ආරක්ෂාවක් සැපයිය හැක්කේ කෙසේ දැයි මම නම් නොදනිමි" යයි ප්‍රකාශ කරමින් 29 දා පෙන්ටගන් ප්‍රකාශකයෙකු ද එම හඬ ම නැඟීය.

පකිස්ථානු ආන්ඩුව ද ඇතුලත්ව නිකුත් කල මුල් ම වාර්තාවල සඳහන් වූයේ, රාවල්පින්ඩි හි ප්‍රචාරක රැලියකින් නික්ම යද්දී භූටෝට මරාගෙන මැරෙන බෝම්බ කරු තෙමේම පුපුරවා ගැනීමට පෙර වෙඩි තබා ඇති බවය. එහෙත් සිකුරාදා වනවිට, අභ්‍යන්තර ආරක්ෂක දෙපාර්තමේන්තු ප්‍රකාශක බ්‍රිගේඩියර් ජවාල් ඉක්බාල් චීමා අවධාරනය කලේ භූටෝට වෙඩි පහරවල් කිසිවක් වැදී නොමැති බවයි. ඒ වෙනුවට ඔහු සඳහන් කලේ, භූටෝ ගමන්ගත් මෝටර් රියෙහි හකුලන වහලයේ ලීවරයක හිස වැදීමේ ප්‍රතිපලයක් ලෙස ඇය මිය ගිය බවයි. ප්‍රහාරය එල්ල වන විට භූටෝ වාහනය තුල සිටගෙන පීපීපී ආධාරකරුවන්ට අත වනමින් සිටියා ය.

ඇසින් දුටුවන් විසින් චීමාගේ ප්‍රකාශයට අභියෝග කර තිබේ. භූටෝගේ ප්‍රධාන නීතිඥයා මෙන් ම පීපීපී ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු ද වන ෆාරුක් නයික් ආන්ඩුවේ ප්‍රකාශ "පදනම් විරහිත" හා "බොරු ගොන්නක්" බව කියා සිටියේ ය.

"එකක් හිසට ද අනෙක බඩට ද වශයෙන් ඇයට උන්ඩ දෙකක් වැදී තිබේ. භූටෝගේ පුද්ගලික ලේකම් නඩීම් ඛාන් හා මැක්ඩූම් අමින් ෆාහිම් යන පක්ෂ නිලධාරියා මෝටර් රිය තුල සිටි අතර ඔවුන් සිදුවූයේ කුමක් දැයි දැක තිබේ." යයි ඔහු පැවසීය.

භූටෝ මියගිය රාවල්පින්ඩි ආරෝග්‍යශාලාව කරා ඇය සමග ගමන්ගත් හා පසුව ඇගේ දේහය මිහිදන් කිරීම සඳහා සූදානම් කල ෂෙරී රෙහෙමන් නම් පීපීපී ප්‍රකාශිකාව රොයිටර්ට ප්‍රකාශ කලේ "ඇගේ හිස පිටුපස වම් පැත්තෙහි උන්ඩයක් වැදීමෙන් සිදුවූ තුවාලයක් තිබුනි. එය අනෙක් පසින් එලියට විත් තිබුනි. එය විශාල තුවාලයකි, ඉන් අධික ලෙස ලේ ගලා තිබුනි"

ඇය තවදුරටත් කියා ඇත්තේ "ඇගේ සිරුර භූමදානය සඳහා සෝදන විට පවා ඇගෙන් ලේ වහනය වෙමින් තිබුනි. ආන්ඩුව දැන් කියන්ට උත්සාහ කරන්නේ ඇය ම සිය හිස තලාගත් බවයි, එය විහිලු සහගතය. එය සැබවින් ම අනතුරුදායක තකතිරු කමකි".

29 දින සවස ඩෝන් රූපවාහිනී ප්‍රවෘතිවල විකාශනය කල වීඩියෝ පටයට අනුව ද සිද්ධීන් පිලිබඳ ආන්ඩුවේ විස්තරය විකාර සහගත බව පෙනීයයි. ආධුනික ඡායාරූප ශිල්පියෙකු විසින් රූගත කල එම වීඩියෝ පටයේ දර්ශනය වන්නේ සන්නද්ධ ඝාතකයෙකු භූටෝ වෙත වෙඩි තබන විට හකුලන වහලය තුලින් සිය මෝටර් රියෙහි නැගී සිටි ඇය ආධාරකරුවන්ට අත වනන ආකාරය යි. බෝම්බය පිපිරීමට පෙර ඇය මෝටර් රිය තුල නොපෙනී ගිය බවත් ඇගේ මෝටර් රිය වටා ආරක්ෂක වලල්ලක් නොතිබූ බවත් ඉන් මනාව දර්ශනය විය.

එහෙත් භූටෝ ඝාතනය පිලිබඳ සිය අභූත විස්තරය මත තවදුරටත් එල්බ සිටීමට මුෂාරෆ් පාලනය අධිෂ්ඨාන කර ගෙන සිටී. "වෛද්‍ය වාර්තාව මගින් සහතික කොට තිබෙන නිවැරදි ම තොරතුරු අප ඔබට ලබාදී ඇත්තෙමු" චීමා 29 දින ප්‍රකාශ කලේ ය.

30 වන දින පලකල නිව්යෝර්ක් ටයිම්ස් පත්‍රයේ මාර්ගස්ථ වාර්තාවකට අනුව "පකිස්ථානු හා බටහිර ආරක්ෂක විශේෂඥයන්, භූටෝ මහත්මිය වෙඩි උන්ඩයකින් මරුමුවට පත් නොවූ බවට ආන්ඩුව කරන අවධාරනය, පකිස්ථානු හමුදා මූලස්ථානය පිහිටි හා අන්තර් සේවා බුද්ධි අංශය නිතර ගැවසෙන නගරයේ (රාවල්පින්ඩි) උද්‍යානයෙන් ඇය පිටව යද්දී ඇගේ වාහනය වටා ආන්ඩුව යොදා තිබූ ආරක්ෂාවේ ලිහිල් භාවය කෙරෙහි යොමුවන අවධානය වෙන අතකට හැරවීම සඳහා යොදා ඇතැයි විශ්වාස කරති."

එහෙත් වෙනත් පැහැදිලි කිරීම් ද ඇත. ස්නයිපර් තුවක්කු කරුවෙකු පිලිබඳ වාර්තාද සැලකිල්ලට ගත් කල්හි, ජනකායක් අතර සිටින පුද්ගලයෙකුට වෙඩිතැබීම සඳහා මරාගෙන මැරෙන බෝම්බයක් පුපුරවා ගැනීමට වඩා වැඩි ඉහල මට්ටමක පුහුනුවක් හා නිපුනතාවක් අවශ්‍ය කෙරේ. වෙඩි තැබීමකින් මරනය සිදුවන අවස්ථාවකදී, වෙඩි උන්ඩ මෙන් ම මිනීමරු ආයුධය ද ඝාතක කුමන්ත්‍රනයේ සුල මුල හෙලි කර ගැනීම සඳහා වැදගත් සාධක බවට පත් වේ.

මෙය සැලකිල්ලට ගත් විට භුටෝ ඝාතනය සිදුවී විනාඩි කිහිපයක් ඇතුලත බලධාරීන් අපරාධය සිදු වූ ස්ථානය සෝදා හැරීමට නියෝග කර තිබීම ද වැදගත් වේ. ජලයට ලේ පැල්ලම් සේදී යන බැවින් ඒ සමග ම බෝම්බ කරුවා හඳුනාගැනීමේදී තීරනාත්මක විය හැකි ඩීඑන්ඒ සාක්ෂි ද නැතිව යයි.

රාවල්පින්ඩි මහ රෝහලේ අධ්‍යක්ෂ මන්ඩල සාමාජිකයෙකු වන අතා මිනල්ලා විසින් නිකුත් කල විවෘත ලිපියක් මගින් ද ආන්ඩුව පකිස්ථානු ජනතාවට බොරු කියා ඇති බව පෙන්නුම් කරයි. ආරෝග්‍යශාලාවේ කාය විච්ඡේදන මහාචාර්යවරයෙකු වූ වෛද්‍ය මොහමඩ් මුසාඩික් ඛාන් භුටෝගේ මරනයට හේතුව වෙඩි උන්ඩයකින් සිදු වූ තුවාලය බවට එදින සවස නිගමනය කල බව මිනල්ලා විස්තර කරයි. පකිස්ථානු නීතිය අනුව මරනයේ හේතුව නිගමනය කල හැක්කේ පශ්චාත් මරන පරීක්ෂනයකින් පමනක් වීම නිසා ඔහු එම කාරනය සිය වෛද්‍ය වාර්තාවට ඇතුලත් නොකලේ ය. ඒ වනවිට රැස්ව සිටි වෛද්‍යවරුන්ගේ විරෝධය නො තකා රාවල්පින්ඩි පොලිස් ප්‍රධානියා වන අසිස් සාවුඩ් පරීක්ෂනය සඳහා නියෝගය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කලේ ය.

ඝාතනය සැලසුම් කලේ පකිස්ථානයේ තලේබාන් නායක බයිතුල්ලා මෙෂූඩ් බව ආන්ඩුව කියා සිටිය ද, මෙෂූඩ්ගේ ප්‍රකාශකයෙකු විසින් එය ප්‍රසිද්ධියේ ම ප්‍රශ්නයට භාජනය කල අතර බලධාරීන් සිය මතය තහවුරු කිරීම සඳහා මොන ම සාක්ෂියක් වත් ඉදිරිපත් කර ඇත්තේ ද නැත. පසුගිය ග්‍රීෂ්මයේ වසිරිස්ථානයේ දී පකිස්ථානු හමුදා භටයන් 300ක් අල්ලාගැනීමේ මෙහෙයුම සංවිධානය කිරීම මගින් ඔහු මිලිටරිය නින්දාවට පත් කිරීමෙන් පසුව, ඔක්තෝබර් 18 වන දින භුටෝ ඝාතන තැත ද ඇතුලුව ප්‍රහාර මාලාවක් සම්බන්ධයෙන් ආන්ඩුව මෙෂූඩ්ට චෝදනා එල්ල කර තිබේ.

පීපීපී ප්‍රකාශක ෆහතුල්ලා බබාර් කියාසිටියේ භුටෝ ඝාතනයේ වගකිවයුත්තා මෙෂූඩ් බවට කෙරෙන ප්‍රකාශ "ගොතනු ලැබූ හා අවධානය වෙනතකට යොමු කිරීමට ඔවුන්ට අවශ්‍යව ඇති බැවින් සාවද්‍ය කථාවක් ද" වන බවත් ය.

පකිස්ථානු ආන්ඩුවේ කථාව සිදුරුවලින් පිරී ඇති අතර මුෂාරෆ්ගේ ඇමෙරිකානු අනුග්‍රාහකයන් අපකීර්තියට පත්වීම හා තන්ත්‍රයට එරෙහි මහජන මතය ඇවිලීයනු ඇතැයි බුෂ් පාලනාධිකරය මත් තැවුලට පත්ව සිටියි. පෙනී යන පරිදි, ඝාතනය පිලිබඳව ජාත්‍යන්තර පරීක්ෂනයකට ඉස්ලමාබාදය ඉඩ දිය යුතුය යි බල කරන්නේ ද යන්න ගැන බුෂ් බලාධිකාරය තුල ප්‍රධාන විවාදයක් සිදුවෙමින් තිබේ.

භුටෝ ඝාතනයෙන් දින ගනනාවකට පසුව බුෂ් පාලනාධිකාරය, වඩාත් ම වැදගත් විරුද්ධ පාක්ෂික නායකයා මරා දමා තිබිය දීත් ජනවාරි 8 වනදාට නියමිත මැතිවරන එයාකාරයට ම පැවැත්විය යුතුයයි කීමට පටන් ගෙන තිබේ.

ආරම්භයේ පටන් ම මැතිවරන ප්‍රෝඩාකාරී ය. ජනාධිපති ලෙස යලි පත්වීමට තමන්ට ඇති සියලු නීතිමය හා ව්‍යවස්ථාමය බාධක ඉවත්කිරීම සඳහා අධිකරනය විරේක කල, හදිසි අවස්ථාව පැවති සති හයක කාලය තුල, ඒවා "සකසනු" ලැබ තිබේ. හදිසි අවස්ථා ආඥාව යටතේ මුෂාරෆ්, දහස් ගනනක් අත් අඩංගුවට ගැනීමට නියෝග කල අතර, දිගට ම බල පැවැත්වෙන පරිදි දේශපාලන වැඩ කටයුතු සීමා කරන නීති හා කුරිරු වාරන නියෝග පැනවීය.

එහෙත්, ප්‍රධාන විරුද්ධ පාක්ෂිකයාගේ ඝාතනයට තුඩුදෙන පරිදි නොතකාහැරීම පිලිබඳව පලල් ලෙස සැකයට බඳුන් වූ පාලන තන්ත්‍රයට ම මැතිවරන "ප්‍රජාතන්ත්‍රවාදීව පවත්වන" ලෙස දැන් කියා සිටීම සිනහවට කාරනයකි.

දැන් පෙනීයන්නේ, 31 වනදාට මැතිවරන කොමිසම සමහරවිට මාස හතරක් දක්වා මැතිවරන කල් දැමීමට තීරනය කරනු ඇති බවයි.

ප්‍රජාතන්ත්‍රවාදී වහන්තරාවක් සැකසීම මගින්, එන්ට එන්ට ම අපකීර්තියට පත්වන මුෂාරෆ් තන්ත්‍රයේ බිඳ වැටීම වලක්වා ගැනීම සඳහා බුෂ් පරිපාලනය වසරකට වැඩි කාලයක් තිස්සේ වෙර දරමින් සිටියි. මෙය යොමුව ඇත්තේ මුෂාරෆ් ද භුටෝ හා ඇගේ පීපීපීය ද අතර බලය බෙදාගැනීමේ එකඟතාවක් සඳහා තල්ලුවක් සපයාගැනීම දෙසට ය.

ඇගේ පාර්ශවයෙන් භුටෝ, බලයේ ප්‍රතිලාභ බෙදාගැනීම සඳහා හවුල් වෙමින් වොෂින්ටනය සමඟ වැඩ කිරීමට ඕනෑවටත් වඩා කැමැත්තෙන් සිටියා ය. පකිස්ථානු ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්හි බොටුව මිරිකීමට අමතරව, සමාජීයව ගිනි අවුලුවන සුලු නව ලිබරල් ප්‍රතිපත්තීන් ක්‍රියාවට නඟා ඇති මුෂාරෆ් ආන්ඩුව ද ඇතුලු පිලිවෙලින් පකිස්ථානයේ මිලිටරි අඥාදායකත්වයන්ගේ අනුග්‍රාහකයා වූයේ වොෂින්ටනය යි.

මුෂාරෆ්ගේ හදිසි නීතියත් දැන් භුටෝ ඝාතනයත් හමුවේ, බුෂ් පරිපාලනයේ ප්‍රතිපත්තිය ආඥාදායකත්වයට ප්‍රජාතන්ත්‍රවාදයේ සලුපිලි ඇන්දවීම බවට පත්ව තිබේ. 30 වන දින වොෂින්ටන් පෝස්ට් පත්‍රයේ ලිපියකට අනුව, "බුද්ධි අංශ නිලධාරීන් හා විශේෂඥයන් අතර සාංකාව තිබියදී ම, මුෂාරෆ් වටා කරකැවෙන දේශපාලන මධ්‍යස්ථානයක් නිර්මානය කිරීමට සහාය වන ක්‍රියාවලියක් වෙනුවෙන් පරිපාලනය පසුගිය මාස 18 පුරා ම සැකසූ සැලැස්ම යාන්තමින් එලිදක්වාගෙන තිබේ.

"A සැලැස්ම තව මත් ක්‍රියාවට නැඟී නැත. අප සියලුදෙනා එක්ව, මධ්‍යස්ථ බලවේගයන්ගෙන් එකට එක්වී මැතිවරන පවත්වන ලෙසත් වඩාත් ස්ථාවර පදනමක ආන්ඩුවක් ගොඩනගා ත්‍රස්තවාදයට එරෙහි සටනේ වේදිකාව ලෙස එය යොදාගන්නා ලෙසත් ඉල්ලා සිටිය යුතුය" යි පකිස්ථානු ප්‍රතිපත්තියට සම්බන්ධ පරිපාලනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ප්‍රකාශ කලේ ය.

මේ සම්බන්ධයෙන් බවුචර්, දේශපාලන කටයුතු පිලිබඳ එජ සහකාර රාජ්‍ය ලේකම් නිකොලස් බර්න්ස් හා අනෙකුත් නිලධාරීන්, භුටෝ ඝාතනය හමුවේ ප්‍රකාශකල මැතිවරන වර්ජනය කිරීමේ තීරනය අත්හරින ලෙස අනෙක් ප්‍රධාන විරුද්ධ පක්ෂය වන පකිස්ථානු මුස්ලිම් ලීගයට (නවාස්) බලකර තිබේ.

පත්‍රයට අනුව, එක්සත් ජනපදයේ අනෙක් අරමුන පීපීපී ය කැබලිවී යාමෙන් වලක්වා ගැනීමය. එහි දේශපාලන ව්‍යාපාරය මුලුමනින් ම භ්‍රමනය වන්නේ "යාවජීව සභාපති" වූ බෙනාසීර් භුටෝගේ පුද්ගලික ආයාචනයක් වන සිය පියාගේ "වීරත්වයේ" නීති යුක්ත භාවය වෙනුවෙන් කරන කන්නලව්ව වටාය.

30 දින රැස්වූ පීපීපී විධායකය එහි සභාපති ලෙස ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාල සිසුවෙකු හා බෙනාසීර් භුටෝගේ 19 හැවිරිදි පුත්‍රයා වූ බිලාවල් භුටෝ පත්කර ගත්තේය. භුටෝගේ දෙවන කැබිනට් මන්ඩලයෙහි ආයෝජන ඇමති ලෙස කටයුතු කරද්දී අල්ලස් ලබාගැනීමේ හේතුව නිසා "සියයට දහයේ මහතා" යන අන්වර්ත නාමයෙන් හැඳින්වූ භුටෝගේ සැමියා වන අසෆ් අලි සර්ඩාරි පීපීපී සම සභාපති ලෙස කටයුතු කරනු ඇත.

පීපීපී නායකත්වයේ අනු පිලිවෙලෙහි පවුල් ස්වභාවය සලකුනු කරන්නේ පක්ෂයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවයයි. අතීතයේදී පීපීපී ය "ඉස්ලාමීය සමාජවාදී පක්ෂය" ලෙස හඳුන්වාගත් අතර අද ද පකිස්ථානු පීඩිතයන්ගේ පක්ෂය බව කියාගනු ලැබුව ද, භුටෝලා මත් සින්ඩ් හි විශාල ඉඩම් හිමි පවුල්වලින් පැවත එන්නෝය. සින්ඩ් හි ග්‍රාමීය ප්‍රදේශ අද දක්වා මත් පවත්නා වැඩවසම් ස්වභාවයේ පීඩනය සම්බන්ධයෙන් කුප්‍රකට ය.

මැතිවරන කවදා පැවැත් වුවත් පීපීපී ය තව මත් ඒවාට තරග කරන බව සර්ඩාරි ප්‍රකාශයට පත් කර තිබේ. ලේවලට වඩා පන්ති අවශ්‍යතා ඝනත්වයෙන් වැඩි බව පෙන්වා දෙමින් ඔහු, පීපීපී අරගලය " ආන්ඩුව තුල සිටින මිනිසුන් කන්ඩායමකට එරෙහිව මිස මිලිටරියට එරෙහිව නොවේ" යයි කියා සිටිමින් මිලිටරියට විවෘත ආයාචනයක් කලේ ය. සිය බිරිඳගේ අවමඟුලේදී සින්ද් බෙදුම්වාදී සටන් පාඨ මතුකල අය ද ඔහුගේ හෙලා දැකීමට ලක් විය.

© www.wsws.org